ප්‍රභා කරුණා ගැටුමට වසරයි

ආරක්ෂාව

මඩකලපුව හා අම්පාර විශේෂ සන්නද්ධ නායකව සිටි විනයාගම්ුර්ති මුරලිදරන් හෙවත් කරුණා අම්මාන් සහ කොටි සංවිධානය අතර ඇතිවූ විරසකයට මේ මාසය වන විට අවුරුද්දක් ගතවී හමාරය.

කරුණාගේ බෙදීයාමෙන් කොටි සංවිධානයට මේ වනවිට හමුදාමය වශයෙන් හෙණ පහරක් එල්ල වී හමාරය. එපමණක් නොව එහි දේශපාලනම පදනමද දෙදරා ගොස් හමාරය. මේ වන විට එය මහාවා පෙන්නුම් කර ඇත.

කොටින්ගේ ඊළාම් නිර්මිම සංකල්පයේ ඊළාම් සිහිය්මෙන් නැගෙනහිර පළාතෙන් කොටසක් අහිමිවන ලකුණු ද මේ සමග පහළ වී ඇත. මෙම-ගින් කොටින්ගේ ඊළාම් රාජ්‍යයද සිහිනයක් වන ලකුණු පෙන්නුම් කර ඇත.

"වන්නියෙන් ඇවිත් මගේ එක හටයෙකුගෙඩිහම සීරෙන දෙයක් හෝ කළොත් වන්නි නායකත්වයට හොඳ පාඩමක් උගන්වනවා. පුළුවන් නම් මගේ භූමියට අත තියන්නැයි මම වන්නි නායකත්වයට අභියෝග කරනවා" යැයි වරෙක කරුණා අම්මාන් අභියෝග කළේය.

ඒ වන්නි පාලනයෙන් පෙන්වී ගොස් දින හතරකට පසුවය (2004 මාර්තු 06 වැනිදා) මඩකලපුව, මීනගම කොටි කඳවුරේ දී කරුණා අම්මාන් මෙම අභියෝගය කළේය.

කරුණා අම්මාන්ව කොටි සංවිධානයෙන් නෙරපනු ලැබූ බව වන්නි කොටි මූලස්ථානය නිවේදනය කරනු ලැබුවේද එදිනම (මාර්තු 6) දහවල්ය.

පසුදිනම (7) නැගෙනහිර පළාතේ මාර්ගවලට පිවිසුණු දහස් සංඛ්‍යාත දෙමළ වැසියන් විසි වසරක ඉතිහාසයේ පළමු වතාවට ප්‍රභාකරන්ගෙපඔයන් ප්‍රසිද්ධියේ ගිනි තබමින් කරුණාගෙනෙකුත්වය තවදුරටත් අවශ්‍ය බව කියමින් පෙළපාලි යන්නට පවා ඉදිරිපත් වූහ.

උතුරේ කොටි සාමාජිකයන් සැප විදීමින් නැගෙනහිර කොටි සාමාජිකයන් දර දිය ඇදීමත් මුල්කරගෙන ඇතිවූ කරුණා-ප්‍රභා විරසකයේ මුල් අවස්ථාව මෙවැනි පසුබිමක් ගත්තේය.

දෙදෙනා අතර අභ්‍යන්තර ආරවුල හට ගැනීමට ප්‍රථම ප්‍රභාකරන් වටා සිටින පොවටු අම්මාන්, තම්ලේන්ර් ඇතුළ කණ්ඩායම විසුරුවා හරින ලෙස කරුණා අම්මාන් කොටි නායකයා වෙත ලිපි යවමින් ඉල්ලා තිබිණි.

ඔබ තනි නීරණයක් ගෙන මට කියන්නේ ඔබ කියන දෙයම කරන්න කියා දැයි ප්‍රභාකරන් එහිදී කරුණාගෙන් ප්‍රශ්න කර තිබිණි.

මෙම ප්‍රශ්න මුල්කරගෙන ඇතිවූ බිඳීයාමෙන් දින 34ක් ගිය තැන නැගෙනහිරට එරෙහිව ප්‍රධාන පෙළේ මෙහෙයුමක් දියත් කිරීමට වන්නි කොටි සමත් වූහ. ඒ ඉකුත් වසරේ අප්‍රේල් 09 සිකුරාදාය.

මෙම ප්‍රහාරයට එක්වීමට කොටි ජ්‍යෙෂ්ඨයින් වන ස්වර්ණම්, බාල්රාජ්, කපිල් අම්මාන්, භානු ඇතුළ ප්‍රධාන පෙළේ කොටි නායකයින් නැගෙනහිරට පැමිණියහ. විසි වසරකට පසුව කොටි නායක ප්‍රභාකරන් ද නැගෙනහිර මායිමට පැමිණ තම සාමාජිකයන් දිරිගන්වා ගිය බව එවකට කියවිණි.

මෙම ප්‍රහාර එල්ල වීමට සතියකට ඉහතදී කරුණා විසින් උතුරෙන් පැමිණ සිටි සිවිල් වැසියන් දෙදාහක මඩකපුවෙන් පලවා හැර තිබිණි. ඒ මාර්තු 31 වැනිදාය.

අප්‍රේල් 09 දා වන්නි කොටි ප්‍රහාරය එල්ල වී පැය 72ක් ගත වන්නට මත්තෙන් නැගෙනහිර පළාත අතහැර යාමට කරුණා ඇතුළු ඔහුගෙනායකයෝ තීරණය කළහ.

වෙරගල්ආරු ගඟට පහළින් කඳවුරු බැඳ සිටි කරුණා කල්ලි වෙත නොසිතූ ලෙසින් එල්ල කළ පළමු ප්‍රහාර හමුවේ කිලෝමීටර් 34ක් පසු බැසීමට කරුණා පිලට සිදුවිණි.

තමන්ටද දිගින් දිගට ප්‍රහාර දියත් කිරීමට හැකියාව තිබුණද නැගෙනහිර තරුණයන්ගෙ ජීවිත ගැන සලකා ප්‍රහාර දියත් නොකර පසු බැසීමට තීරණය කළ බව කරුණා අම්මාන් එහිදී හෙළි කළේය.

තොප්පිගල දක්වා පැමිණ එහි බලය ස්ථාපිත කරගත් කරුණා අම්මාන් ජ්‍යෙෂ්ඨ සාමාජිකයන් හැරෙන්නට සියළුම සාමාජිකයන්ට සංවිධානය අතහැර යන්නැයි දැනුම් දුන්නේය. ඒ අප්‍රේල් 10 වැනිදාය.

ඒ අනුව පසුදිනම (11) තම සන්නද්ධ අංග සාමාජිකයන් නිවෙස්වලට යැවීමට කරුණා අම්මාන් කටයුතු යෙදීය.

එදා වන්නියෙන් මුල් ප්‍රහාරය එල්ල වනතුරුම කරුණා අම්මාන් එවැනි ප්‍රහාරයක් බලාපොරොත්තු නොවූන බවත්, කරුණා අම්මාන් ඒ වන විට පත්වූ නව රජය සමග සාකච්ඡා කර නැගෙනහිරට වෙනම පාලනයක් පවත්වාගෙන යාමේ නව බලාපොරොත්තුවෙන් සිටි බවද හෙළි විය.

විසි වසරක් පුරා ඊළාම් රාජ්‍යයක් ඉල්ලා



විමුක්ති සටනක නිරත වුණු කරුණා අම්මාන් සිය සංවිධානයෙන් වෙන්ව මාසයක් ගතවී යාමත් සමග සිය සන්නද්ධ අංගය මුළුමනින්ම විසුරුවා හැරියේ මෙවැනි පසුබිමක් තුළය.

මේ සමග මුස්ලිම් මන්ත්‍රීවරයකු සමඟින් ආරක්ෂාව පතා කොළඹට පැමිණි කරුණා අම්මාන් රජයේ ආරක්ෂක ප්‍රධානීන් හා දේශපාලන පක්ෂ නායකයින්ද මුණගැසී සාකච්ඡා කළේය.

එතැන් පටන් ඇරඹුණු ප්‍රභා කරුණා

ගතවූ වසරක කාලය තුළ වන්නි කොටි ප්‍රහාරවලින් කරුණා පිළේ සන්නද්ධ සාමාජිකයන් 32 ක්ද ආධාරකරුවන් 36ක්ද ඝාතනයට ලක්වී ඇත. මෙම ඝාතන හා සැලකිමේදී කරුණා පිළේ ප්‍රහාරවලින් වන්නි කොටින්ගේ සන්නද්ධ අංශ සාමාජිකයන් 119ක් මියගොස් තිබේ. ඔවුන්ගෙආධාරකරුවන් හයදෙනෙකුද මෙම කාලය තුළ ඝාතනය වී ඇත.

ගැටුම මේ වන විට නැගෙනහිරින් ඔබ්බට යමින් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මායිම් ගම්මාන දක්වා පැතිර ගොස් ඇත.

මෙම කාල සීමාව තුළ කරුණා පිල එල්ල කළ ප්‍රහාර සැලකීමේදී වන්නි කොටින් මඩකලපුව කොටි පාලන ප්‍රදේශවල බලවත් පසුබැසීමකට ලක්ව ඇති ආකාරයක් පෙනී යයි. ඔවුන්ට කිසිදිනෙක තොප්පිගල ඇල්ලීමටද හොඳාකි විය.

ඉකුත් වසරේ ජූලි 07 වැනිදාට යෙදුණු කළු කොටි දිනයේදීම කොටි නැගෙනහිර මෝටාර් අංග ප්‍රධානී කුරුංජ මාමා කරුණා පිළේ ප්‍රහාරයකින් වන්දාරමුල්ල සරසවිය අසලදී මරුමුවට පත්විය. කනගරත්නම් රත්නරගුරු (රෝනේ) නමැති කොටි මහා වීර පවුල් භාර නායකයා එහිදී තුවාල ලැබීය.

එදිනම මඩකලපුව කොටි දේශපාලන නායක සේනාධිරාජ් ඝාතනය වූ අතර කොටි නැගෙනහිර ක්‍රීඩා අංශ භාර නායක නිලන් තුවාල ලැබීය. කොටින්ගේ කළු කොටි දිනය කරුණා පිළ විසින් එදා සමරණු ලැබුවේ වන්නි කොටි නායකයන් දෙදෙනෙකු අහිමි කරමිනි.

මෙයින් පසුව කරුණා පිළේ අම්පාර සන්නද්ධ නායක සච්චි මාස්ටර් හෙවත් මාරන් රැල්ල යළිත් එසේ ඇරඹීය.

මින් පසුව වන්නි කොටින්ට අභියෝග යක් වූ කරුණා පිල දිගින් දිගටම ප්‍රහාර එල්ල කරන්නට විය. වැලිකන්ද, පුල්ලයාර්ඳඩි හිදී නැගෙනහිර කොටි දේශපාලන නායක කොලැයෙයන් ඇතුළ හය දෙනෙක් මරාදමමින් වන්නි කොටින් ඝාතියට පත් කරන්නට කරුණා පිළ සමත් විය. ඒ මෙම පෙබරවාරි 07 වෙනිදාය.

මෙහිදී ඝාතනය වුණු දෙමළ සන්ධාන මන්ත්‍රී ආරියනායගම් චන්ද්‍රනේරුගේ අභාවයද වන්නි කොටින්ට දරාගත නොහැකි විය.

කොටින්ගේ අවි ආවරණේ ප්‍රධාන සහායකයෙකු වූ චන්ද්‍රනේරු අහිමිවීමෙන් වූ පාඩුවටත් වඩා වැඩි එකක් විය.

මෙම සිද්ධියෙන් කිපුණු කොටි සංවිධානය මෙම ඝාතනවලට රජයේ හමුදාවන්ද හවුල් වී ඇතැයි චෝදනා කළේය. වැලිකන්ද ප්‍රදේශයට පිස්තෝල කල්ලි, මරාගෙන මැරෙන බෝම්බකරුවන් ඇතුළු සන්නද්ධ කණ්ඩායම් එවීමට වන්නි කොටින් කටයුතු කළහ.

රජයේ හමුදා ප්‍රධානීන්ට එරෙහිව ප්‍රහාර එල්ල කරන ලෙසද නියෝග කළේය. මේ සමග වැලිකන්ද කොළඹකනවාඩියට පැමිණි සිවිල් වැසියන් පස්දෙනෙකු හා ප්ලොට් සාමාජිකයෙකු මරා දමීමට වන්නි කොටි ක්‍රියා කළහ.

මින් පසුව වන්නි කොටි ක්‍රියාකාරකම් වැඩිවන්නට විය. වරෙක වැලිකන්ද 23 වන සේනාංකයට ඇතුළු වීමටද උත්සාහ කළහ.

රජයේ පාලන ප්‍රදේශවලට ආයුධ සන්නද්ධව පැමිණියහොත් වෙඩි තබන බව මේ සමග වැලිකන්ද 23 වන සේනාංකාධිපති මේජර ජනරාල් විජේගුණවර්ධන මහතා කොටින්ට අනතුරු හැඟවිය.

කොටි ක්‍රියාකාරකම් වැලක්වීමේ අරමුණින් කඳුරුවෙලටද නව කඳවුරක් යෙදවිය.

සටන් විරාම ගිවිසුමින් ලද අවසරය මත කොටින්ට උතුරු නැගෙනහිර පමණක් සැරිසැරිය හැකි මුත් වන්නි කොටින් පොළොන්නරුව දිස්ත්‍රික්කයටත් පැමිණ විවිධ ක්‍රියාකාරකම් කරන බව 23 වන සේනාංකාධිපතිවරයා මේ අතරතුර සටන් විරාම නිරීක්ෂණ කමිටුවට පැමිණිළි කළේය.

මෙය සටන් විරාමය කැඩීමටත් වඩා බරපතල දෙයක් බව හෙතෙම පෙන්වා දුන්නේය.

මෙවැනි කාරණා ඉස්මතු වෙමින් තිබියදී 23 වැනි සේනාංකාධිපති හා ඔහු යටතේ සිටි බුද්ධි අංශ නිලධාරීන් ඝාතනය කිරීමටද කොටි සැලසුම් සෑදීය.

මේ සඳහා වැලිකන්ද, කරපොල ගමේ අයි.නන්ද නම් සිංහල ජාතික කොටි සාමාජිකයකුට කරදියනාරු කොටි කඳවුරේදී බෝම්බ පිළිබඳ පුහුණුවක් ලබාදී කල්ලේ බෝම්බ සමඟින් ප්‍රහාරයට එවූ අවස්ථාවේ ඉකුත් සතියේදී කඳුරුවෙලදී අත්අඩංගුවට පත්විය.

මේ ආකාරයට පැමිණි වැලිකන්ද පොළොන්නරුව මායිමේ ප්‍රභා-කරුණා ගැටුම මායිම් ගම්මානවල වාසින්ටද, ආරක්ෂක ප්‍රධානීන්ටද හිතියක් වී හමාරය.

මෙම මායිම් ප්‍රදේශවල සිදුවන දෙපාර්ශවයේ ගැටුම්වලින් සාමාන්‍ය වැසියන් බේරා ගැනීම රජයේ ආරක්ෂක අංශවල ප්‍රධාන වගකීම වී ඇත. එම ප්‍රශ්නයට විසඳුමක් දීම ආරක්ෂක අංශවලට ද බරපතල ප්‍රශ්නයක් වී හමාරය.

එම ප්‍රදේශවල ආරක්ෂාව තරකිරීමට නම් සෝදිසි මෙහෙයුම්වලදී ගැටුමක් ඇති නොවීමට වග බලා ගත යුත්තේ දෙනට සටන් විරාමයක් ක්‍රියාත්මකව පවතින නිසාය.

උතුරේ මෙන්ම ආරක්ෂක වැටවල් නොමැති නිසාත් මායිම් පිළිබඳ ප්‍රශ්නද නැගෙනහිර පළාතේ පවතින නිසා ආරක්ෂාව තර කිරීම ප්‍රශ්නයක් වනු ඇත.

එහෙත් කෙසේ හෝ සාමාන්‍ය වැසියන්ගේවිත රැක ගැනීම ආරක්ෂක අංශවල වගකීම වනු ඇත.

කරුණා ප්‍රභා ප්‍රශ්නය ඇතිවී ගතවූ වසරක කාලය තුළ වන්නි කොටින් විසින් නැගෙනහිර පළාතේ නිරායුධ සාමාන්‍ය වැසියන් හැටදෙදෙනෙක් (62) ඝාතනය කර ඇත. කරුණා පිළට සහාය දක්වූවයේ යැයි සිතා මෙම ඝාතන කර ඇත.

ගතවූ වසරක කාලය තුළ වන්නි කොටි ප්‍රහාරවලින් කරුණා පිළේ සන්නද්ධ සාමාජිකයන් 32 ක්ද ආධාරකරුවන් 36ක්ද ඝාතනයට ලක්වී ඇත.

මෙම ඝාතන හා සැලකීමේදී කරුණා පිළේ ප්‍රහාරවලින් වන්නි කොටින්ගේ සන්නද්ධ අංග සාමාජිකයන් 119ක් මියගොස් තිබේ. ඔවුන්ගෙආධාරකරුවන් හයදෙනෙකුද මෙම කාලය තුළ ඝාතනය වී ඇත.

මෙම සංඛ්‍යා සඳහා බැලීමේදී පැහැදිළි වන්නේ වන්නි කොටින්ට අහිමි වූ බලය දිනා ගැනීම සඳහා කරුණා පිළේ සාමාජිකයන් වෙනුවට නැගෙනහිර අභිංසක වැසියන් බිල්ලට ගන්නා බවය.

කෙසේ වෙතත් මේ වන විට කරුණා පිල යළින් එක් රැස්වී තම කඳවුරුවල පුහුණුවීම් අරඹා ඇත. අද හෙටම කරුණා පිල හා ප්‍රභා පිල අතර ගැටුම ඇතිවීමේ අවදානමක්ද ඇත.

වසරක් ගතවී ඇතත් නැගෙනහිර බලය අල්ලා ගැනීමට තබා කඳවුරුවලින් එලියට බැසීමට හැකි තත්වයක් ඇතිකර ගැනීමටවත් වන්නි කොටින් අසමත් වී ඇත.

තිස්ස රවීන්ද්‍ර පෙරේරා